නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 103 - 108
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# හිම දිය වී හිමාලයේ ගීතය විචාරය

**හිම දිය වී හිමාලයේ**

හිම දිය වී හිමාලයේ
යමුනා ගඟ නගයි තරංගා
සුදු පෙණ කැටි බලන්න රාධා....
සුළඟ හමයි සීතල සාදා
සීතල ගිනි ගනීද ක්‍රිෂ්ණා....

සිනා රැලි නගා උතුරන
ඔය හදවත් නීල ජලාසේ
පීනන මේ ස්වර්ණ හංසයෝ
අකීකරු ද මෙතරම් රාධා....
ඉඩ දී දෙන්නට දඬුවම්
දෑස පියා ගන්නම් ක්‍රිෂ්ණා....

හිම දිය වී හිමාලයේ....

මල් පෙති පොඩි වී ඉකිලන
මේ හෝපලු යහන් තලාවේ
සඳ දිය මිණිමෙවුලට වැටිලා
දෑස නිලංකාරයි රාධා...
ගිලිහී ගියදෙන් මිණි කැට

දෑස වසා ඉන්නම් ක්‍රිෂ්ණා....

හිම දිය වී හිමාලයේ....

ගායනය - අමරසිරි පීරිස් සහ වසන්තා තිලකාංගනී
සංගීතය - ඩැනිස්ටර් පෙරේරා
පද රචනය - ධම්මික බණ්ඩාර

ධම්මික බණ්ඩාරගේ මෙම ගීයට පදනම වන්නේ ශ්‍රී ජයදේව නම් ඍෂිවරයා රචනා කළ ඉන්දියානු සංස්කෘත ශෘංගාරාත්මක ග්‍රන්ථයක් වන **ගීත ගෝවින්දය** යි. එහි ගෙතී ඇත්තේ ක්‍රිෂ්ණා හා රාධා අතර ප්‍රේම වෘත්තාන්තය යි. රාධා හා ක්‍රිෂ්ණා වාසය කරන්නේ හිමාල වනයේ ගොපලු ගමක වන අතර, රාධා යනු එම ගමෙහි ගොපලු ගෝත්‍රයේ ජීවත් වූ රූපයෙන් අග තැන්පත් වූ ගොපලු දියණියකි. ක්‍රිෂ්ණා එතරම් කඩවසම් පෙනුමක් නොතිබුණ මිටි, ශරීර වර්ණයෙන් අඩු තරුණයෙකි. ඔහු සෑම විට ම සංගීතයට ඇල්මක් දක්වන අතර, නිතර ම ඔහු අත බටනළාවක් දක්නට ලැබුණි.

කෙසේ නමුත් රාධා හා ක්‍රිෂ්ණා එකිනෙකාට ආදරය කළ අතර, ක්‍රිෂ්ණාගේ මිහිරි වූ වස්දඬු වාදනය නිසා ම ඔහුට වෙනත් ගොපලු තරුණියන්ගේ ආකර්ෂණය වැටුණි. ක්‍රිෂ්ණාත් මොවුන් සමග රමණයෙහි යෙදෙමින් කෙළි දෙළෙන් කාලය ගත කළේ ය. එහෙත් මේ සම්බන්ධ ව තම ප්‍රේමවන්තිය වන රාධා එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. රාධා පමණක් නො ව කිසිදු ප්‍රේමවන්තියක් තම ප්‍රේමවන්තයා වෙනත් තරුණියන් සමග බෙදා ගැනීමට අකමැති වන අතර, රාධාටත් එවැනි ම සපත්නීරෝෂයක් ඇති වේ. වෙනත් තරුණියන් තම ප්‍රේමවන්තයා සමග සිටින විට ඇයට ඊර්ෂ්‍යාවක් ඇති වේ. මේ හේතු නිසා රාධා, ක්‍රිෂ්ණාගෙන් දුරස් වීමට පටන් ගනියි. එහෙත් රාධා සැබැවින් ම ක්‍රිෂ්ණාට ආලය කළ තරුණිය යි. අනෙක් අතට ක්‍රිෂ්ණා ද රාධාට ආලය කිරීමට පටන් ගනියි. මෙලෙස දෙතැනක සිට ඔවුන් ඔවුන්ගේ ආදරේ මෙනෙහි කරන අතර දෙදෙනා විප්‍රලම්භ ශෘංගාරයෙන් සිටියි. අවසානයේ දී මෙම වෙන් වීම දුටු ගමෙහි ස්ත්‍රීන් මොවුන් නැවත එක් කිරීමට පියවර ගන්නා අතර, වෙන් වී සිටි ඔවුන් නැවත හිමාල වනයේ කන්ද පාමුල ඇති හෝපලු වනයේ දී හමු වෙයි. එලෙසින් වෙන් වී සිට නැවත එක් වන අවස්ථාවේ ඇති වන හැඟීම මෙම ගීතයෙන් නිරූපණය කිරීමට ධම්මික බණ්ඩාර සමත් වී ඇත. රාධා ක්‍රිෂ්ණා අතර හට ගත් ආලය හා එය මෝරා රමණය දක්වා ගමන් කරන ආකාරය මෙම ගීතයෙහි දක්නට ලැබේ.

9 772950 655005

ප්‍රථමයෙන් ම ඔවුන් වෙන් වීමෙන් ඇති වූ විප්‍රලම්භ ශෘංගාරයත්, පසු ව මොවුන්ගේ එකතු වීමෙන් ඇති වූ සම්භෝග ශෘංගාරයත් උපරිම තලයට ගෙන ඒම මූලික කර ගනිමින් මෙම නිර්මාණය කිරීමට ධම්මික බණ්ඩාර කටයුතු කර ඇත. සාමාන්‍ය සමාජය ප්‍රසිද්ධ ලෙස කතාබහට ලක් නොකරන එහෙත් කතාබහට ලක් විය යුතු මාතෘකාවක් වන තරුණ සම්භෝගය මෙහි දී නිරූපිත ය. අප රට ශිෂ්ටාචාරගත ව, සදාචාරාත්මක ව ඇති රටක් වන අතර එම නිසා මෙම මාතෘකාව පිළිබඳ වර්තමානය වන විට ප්‍රසිද්ධියේ කතා නොකළ ද එය මූලික මිනිස් අයිතිවාසිකම්වලින් එකකි. ආහාර, නින්ද සේ ම ලිංගික අවශ්‍යතාව ද ජීවියෙකුගේ පැවැත්මට අත්‍යවශ්‍ය වේ. එහෙත් අද වන විට සාහිත්‍ය නිර්මාණකරුවාට මේ පිළිබඳ කතා කිරීම අභියෝගයක් වී ඇත. එයට හොඳ ම නිදසුනක් වශයෙන් හිම දිය වී හිමාලයේ ගීතය රචනා කළ ධම්මික බණ්ඩාරගේ ම නිල් කැට වැස්ස නම් ගීත ගණනාවක් ඇත. එම ගීත සැම එකක් ම පාහේ ජනප්‍රිය වුණත් මේ ගීතය ජනප්‍රිය වීමට ප්‍රමාද වූයේ මෙහි වස්තු විෂය හේතුවෙන් බව පැවසිය හැකි ය. එහෙත් මේ පිළිබඳ ප්‍රසිද්ධ වේදිකාවේ කතා කරන්නේ කෙසේ ද? එලෙස කිරීමට හැකි ඉතාමත් ප්‍රතිභාපූර්ණ කලාකරුවෙක්ට පමණි. එවිට සමාජයේ කතාබහට ලක් නොවන මෙවන් සිදුවීමක් ව්‍යංග්‍යාර්ථ මුසු කර, සංකේත යොදා ගනිමින් එම සංකේත ඔස්සේ සියුම් ව ශෘංගාරය අපූරු ලෙස රසිකයාට ඒත්තු ගැන්වීමට හැකි වේ. එවිට නිර්මාණය කිරීමේ දී රචක දක්ෂතාව එහා මෙහා කරමින් සදාචාරයට හානි නොවන ලෙස සහෘද සිත්හි කිඳා බැස්වීම හේතුවෙන් ම ධම්මික බණ්ඩාරගේ මෙම ගීතය අගය කළ යුතු ය. අප මෙම නිර්මාණයේ පළමු පද්‍ය කොටස වෙත අවධානය යොමු කිරීමේ දී,

"හිම දිය වී හිමාලයේ
යමුනා ගඟ නඟයි තරංගා
සුදු පෙණ කැටි බලන්න රාධා....
සුළඟ හමයි සීතල සාදා
සීතල ගිනි ගනී ද ක්‍රිෂ්ණා...."

නොඉවසිලිමත් ලෙස බලා සිටි කාලය උදා වුණි. මොවුන් දෙදෙනා අතර ප්‍රේම සංවාදයක් මූලික කර ගනිමින් ප්‍රථමයෙන් ක්‍රිෂ්ණාත් පසු ව රාධාත් කියන ලෙසින් මෙම පද්‍ය පන්තිය නිරූපිත ය. එහි දී පරිසරයේ සිදු වන සිද්ධි ඇසුරෙන් ප්‍රේමණීය ක්‍රියාකාරකම් සිදු වන ආකාරය පරිසර වර්ණනා ඇසුරෙන් ව්‍යංග්‍යාර්ථවත් ලෙසින් කවියා ඉදිරිපත් කරයි. හිමාලයේ හිම දිය වන සමයෙහි යමුනා ගඟේ ජල මට්ටම ඉහළ යෑම සාමාන්‍ය කරුණක් වුවත් මෙහි අභ්‍යන්තර ව්‍යංග්‍යාර්ථය වන්නේ මොවුන් දෙදෙනාගේ එක් වීමේ දී රාගය උද්දීපනය වීම යි. මෙතෙක් කල් එකිනෙකාගෙන් වෙන් වී සිටි මොවුන් දෙදෙනා නැවත එක් වීමෙන් ඇති වන අධික කාමාශාව මෙයින් ඉස්මතු වේ. ඉන්ද්‍රිය ස්පර්ශ කිරීමට පෙම්වතුන් අතර දැවෙන ආශාවක් පවතී. එලෙසින් මෙම කාමාශාව පද්‍යයෙන් ඍජු ව ම ඉදිරිපත් නොකර ව්‍යංග්‍යාර්ථවත් ලෙස කවියට ඔබ්බවා ඇත්තේ අපූර්ව ආකාරයෙනි.

පරිසරයේ උෂ්ණත්වය වැඩි වීම හේතුවෙන් හිම දිය වීම සාමාන්‍ය දෙයක් වුණත් හිමාලය වනය යනු ලෙහෙසියෙන් හිම දිය වන ස්ථානයක් නොවේ. එම නිසා මෙම පද්‍යයෙන් එක් පසෙකින්

9 772950 655005

මොවුන් දෙදෙනාගේ එකතු වීමෙන් පරිසරයේ සිදු වන සිදුවීම් විපර්යාස නිරූපණය කරන අතර, අනෙක් පසින් හිමාලය වනය උසට හිම ලෙසින් මෙතෙක් කල් කැටි වී තිබූ සඟවා ගෙන සිටි රාග ආශාව අද උණුසුම් වී හැඟීම් ලෙසින් මෝදු වී යන ආකාරයට ජලය ගලා යන රිද්මය සංකේතවත් කරමින් ඉදිරිපත් කර ඇත. එනම් යමුනා ගඟ ගලා යන්නේ සුදු පෙණ කැටි නංවමිනි. දීර්ඝ පෙම් සටනකින් පසු රාධාගේත්, ක්‍රිෂ්ණාගේත් සිතිවිලි ප්‍රේමණීය අදහස් ගලා යන ආකාරය ප්‍රේමය දෝර ගලා යාමක් ලෙස කවියා දක්වා ඇත.

"සුදු පෙණ කැටි බලන්න රාධා" ක්‍රිෂ්ණා රාධාට ආරාධනා කරන ලද්දේ තමන්ගේ ඇඟ පුරා නළියන අසීමිත ආශාවන්ගෙන් රිද්මය බලන ලෙසිනි. තමන්ගේ ආදරය සුදු පෙණ කැටි මෙන් පවිත්‍ර බවත් එන හැඟීම් පරිසරය සිද්ධි හා මුසු කරමින් ඉදිරිපත් කර ඇති ආකාරයත් අපූරු ය. ප්‍රේමාලිංගනයේ දී කවියා ගෙන එන උපරිම රසය උපරිම තෘප්තිය සම්භෝග රසයේ ස්වභාවය කවියා වචනවලට කැටි කර ඇත්තේ මතුපිටින් බැලූ බැල්මට නොපෙනෙන ව්‍යංග්‍යාර්ථවත් ආකාරයට ය. සාමාන්‍යයෙන් ප්‍රේමයේ දී ගැහැනු ඉතා ම සම්භාව්‍ය නමුත් නියම ප්‍රේමවන්තයා ඉදිරිපස සම්භාව්‍යයට වඩා උණුසුම් ශෘංගාරයට රාධා නිතැතින් ම ලොල් වේ. මෙහි දී නියම ප්‍රේමවන්තයන් යනුවෙන් අදහස් කරනුයේ විවාහ වූ යුවලක් පමණක් නොවේ. විවාහ වුවත් හිතින් දුරස් වූ  අය සුලබ ය. එහෙත් මෙහි දී පරිපූර්ණ වූ ආදරයක් නිසා සිත් මුසපත් වූ දෙදෙනෙකු පිළිබඳ පැවසේ.

අනෙක් පසින් රාධාත් මෙම ආලිංගනයට එකහෙළා ම සූදානම් බවක් පෙනේ. මේ ආලිංගනයට නොඉවසිලිමත් ලෙසින් සිටින මෙන් රාධා ක්‍රිෂ්ණාගේ පැනයට එකහෙළා ම පිළිතුරු දෙයි. "සුළඟ හමයි සීතල සාදා, සීතල ගිනි ගනී ද ක්‍රිෂ්ණා" ඇය පවසන්නේ සීතල සාදමින් සුළඟක් හමා යනවා සීතල පරයා සුළඟ ගිනි ගනී ද? ලෙසිනි. එනම් සීතල පරයා රති ආශාව ඇති වේ ද? යනුවෙන් අසා සිටී. සාමාන්‍යයෙන් ව්‍යංග්‍යාර්ථයෙන් යමක් කීමට කාන්තාවන් ඉතා ම දක්ෂ වන අතර මෙහි දී රාධාත්  එසේ ම ය. ඇය ව්‍යංග්‍යාර්ථවත් ලෙස ක්‍රිෂ්ණාට කාමාරාධනාවක් කිරීමක් මෙහි දී ඉස්මතු වී පෙනේ. ඇය ක්‍රිෂ්ණා ව ඒ සඳහා පොලඹවයි. ඇය ව්‍යංග්‍යාර්ථයෙන් සීතල සුළඟ නිසා තමාට සීතල බවත් එහෙයින් උණුසුම ලබා දී සීතල නැති කරන ලෙස ක්‍රිෂ්ණාට ඇරයුම් කරමින් ඉල්ලා සිටියි. එලෙසින් උණුසුම් වීම ඔබ්බට ගොස් සීතල ගිනි ගනී ද? අසන්නේ රාග ගින්න ඇති වේ ද? යනුවෙනි. සහෘදයන් වන අපට මොවුන් දෙදෙනා තනි ව ම සිටින යමුනා ගං තෙර මැවී පෙනේ. සීතල පරයා යමින් සම්භෝගය සඳහා අවැසි පරිසරයට සියල්ල සූදානම් ය. ඇය මෙම ප්‍රමාදය ගැන ප්‍රශ්න කිරීමක් කරයි. පණ්ඩිත් අමරදේවගේ 'කුමරියක පා සළඹ සැලුණා' ගීතයෙන් ද මෙවැනි ම අනුරාගී සිතුවිලි හා සටන් වදින ඉතා ම අලංකාර පද රචනයක් පෙනෙයි.

"සිනා රැලි නඟා උතුරන
ඔය හදවත් නීල ජලාසේ
පීනන මේ ස්වර්ණ හංසයෝ
අකීකරු ද මෙතරම් රාධා....
ඉඩ දී දෙන්නට දඬුවම්

දැස පියා ගන්නම් ක්‍රිෂ්ණා...."

මෙහි දී කවියා අපූරු ලෙස රූපක යොදා ගනිමින් ක්‍රිෂ්ණාගේ ආදරය සමග රාධාගේ හදවත නම් වූ නීල පිරිසිදු ජලාශයෙහි හංසයන් පිහිනන ආකාරය විස්තර කරයි. එය රාධා හා ක්‍රිෂ්ණාගේ ආදරයේ පිවිතුරු බවට උපමා කර ඇත. පවිත්‍ර වූ ආදරය නිසා රාධාගේ සිත සතුටින් පිරෙන බව ප්‍රකාශ වේ. රාධාගේ හදවත ගිලිහී ගොස් ශෘංගාරය උපරිමයෙන් කැළඹී ඇති අවස්ථාවක් ගී පද රචකයා අකුරුවලට අමුණා ඇත. රාධාගේ ළැම නීල ජලාශයකට උපමා කරමින් උතුරන බව ප්‍රකාශ කරන්නේ ඇය කාම ගින්නෙන් ඇවිලෙමින් සිටින බවකි. කවියා කතා කරන්නේ හදවත නම් වූ නීල ජලාශයේ පිහිනන හංසයන් වැනි වූ රාධාගේ පියයුරු පිළිබඳ ව යි. අතීතයේ සිට ස්වර්ණ හංසයන්ට උපමා කරන්නේ කාන්තාවන්ගේ පියයුරු යි. අපූරු ලෙස මෙම අවස්ථාවේ ක්‍රිෂ්ණාගේ ඇසට හමු වන්නේ රාධාගේ ස්වර්ණ හංස යුවල යි. සම්භෝගයේ දී ගැහැනියකගේ පියයුරු දුටු පමණින් පිරිමියාට ශෘංගාරයක් ඇති වන නමුත් පියයුරු හිමිකාරියට ශෘංගාරයක් ඇති නොවේ. එලෙස හිමිකාරියට ශෘංගාරයක් මතු වන්නේ හදවත නම් වූ නීල ජලාශයේ ප්‍රේමයක් ළෙන්ගතු බවක් ඇති වුවහොත් පමණි. හංසයන් උමතු වන්නේ එවිට පමණි. එනම් පියයුරුවල විපර්යාසයක් සිදු වන්නේ එවිට පමණි. රාධා රන් පැහැ ශරීරයක් ඇති තරුණියක් වන අතර, කාමාශාවෙන් හිනැහෙන රාධාගේ රන් පැහැ ශරීරය චලනය වන විට ඇයගේ පියයුරු ද සෙලවේ. ක්‍රිෂ්ණා මේ අවස්ථාවේ දී දඟකාර ලෙසින් ප්‍රශ්න නගන්නේ මේවා මෙතරම් අකීකරු ඇයි ද? යනුවෙනි. රාධාත් ක්‍රිෂ්ණාගේ ඇසුර සඳහා නොඉවසිලිවත් ව සිටින බවක් "ඉඩ දී දෙන්නට දඬුවම් දැස පියා ඉන්නම් ක්‍රිෂ්ණා" යන පැදි පෙළෙන් ගම්‍ය වේ. රාධා කියා සිටින්නේ ස්වර්ණ හංසයන් අකීකරු නම් ඔවුන්ට දඬුවම් දී හදා ගන්නා ලෙසිනි. මම දැස පියා ගනිමින් ඒවා රිසි සේ අත් විඳීමට දෙන්නම් යැයි රාධා ක්‍රිෂ්ණාට පවසයි. තව ද හංසයෝ කීකරු කර සුරතල් කිරීමට ක්‍රිෂ්ණා පොර බදින ආකාරය මෙම වචනවලින් මැවී පෙනේ.

මෙම ක්‍රියාකාරකම් සියල්ල ම වචනවල සැඟවීමට ධම්මික බණ්ඩාර ගෙන ඇති ප්‍රයත්නය අතිමහත් ය. සිනමාකරුවෙකුට ප්‍රසිද්ධියේ මතුපිටින් කතා කිරීමට නොහැකි මෙවැනි අවස්ථා සංකේත ව්‍යංග්‍යාර්ථ ආශ්‍රයයෙන් ඉදිරිපත් කිරීමට ධම්මික බණ්ඩාර සමත් වී ඇත.

"මල් පෙති පොඩි වී ඉකිලන
මේ හෝපලු යහන් තලාවේ
සඳ දිය මිණිමෙවුලට වැටිලා
දැස නිලංකාරයි රාධා...
ගිලිහී ගියදෙන් මිණි කැට"

ගීත ගෝවින්දයට අනුව මොවුන් දෙදෙනා එකතු වන්නේ හෝපලු එනම් අශෝක වනයක ය. මොවුන් දෙදෙනාගේ යහන වන්නේ අශෝක මල් බිම වැටී ඇති යහන් තලාවකි. මල් මත දෙදෙනා වැතිර සිටී. මෙම කවියෙන් ගම්‍ය වන ආකාරයට රාධාගේ හා ක්‍රිෂ්ණාගේ දැඟලිල්ල, හුරතලය හේතුවෙන් මල් පෙති පොඩි වී පීඩාවට පත් වී ඉකි ගසන බවක් පැවසේ. අනෙක් අතට මිණිමෙවුලට සඳ එළිය පතිත වීමට නම් මොවුන් සිටින්නේ රාත්‍රී සඳ එළියෙන් විය හැකි ය. පෙම්වතුන්ගේ රති

9 772950 655005

ශෘංගාරය සඳහා එක් පසකින් මෙය සුදුසු ම කාල හෝරාවක් නොවේ ද? මෙහි රාධා පැලඳ සිටින්නේ මිණිමෙවුල නම් කාන්තාවන් ඉණෙහි බඳින ආභරණයකි. මිණිමෙවුලට සඳ එළිය වැටී දිලිසෙන බව කවියා කියයි. එලෙස එළිය වැටී ඇති සැටියෙන් දිස් වන්නේ ක්‍රිෂ්ණා බලා සිටින්නේ රාධාගේ මිණි මෙවුල දෙස බව නොවේ ද? මොහොතකට පෙර හංසයන්ට දඬුවම් දීමට සැරසුණු ක්‍රිෂ්ණාගේ දෑස දැන් යොමු වී ඇත්තේ රාධාගේ මිණිමෙවුල දෙසට ය. මෙය ව්‍යංග්‍යාර්ථවත් ලෙස ධම්මික බණ්ඩාර දක්වයි. මැණික් ගල් ඔබ්බවා ඇති මෙම මණිමේඛලාව සඳ එළියෙන් බබළයි. ක්රිෂ්ණා එක් අතකින් කියන්නේ රාධාගේ මණිමේඛලාවට සඳ එළිය වැටීම නිසා දෑස් නිලංකර වන බවකි.

මණිමේඛලාව යනු කාන්තාවගේ ඉණෙහි බඳින ආභරණයක් නම් මෙයින් හැඟවෙන්නේ මේ අවස්ථාවේ දී රාධා වස්ත්‍රවලින් තොර බවකි. රාධාගේ සළු පිළි ඉවත් වූ බවක් පවසන්නේ අසන්නා තුළ එය නිතැතින් ම නිරූපණය වන අන්දමට නොවේ. ව්‍යංග්‍යාර්ථයෙනි. මණිමේඛලාවට එළිය වැටී දෑස් නිලංකාර වන බවක් පවසන්නේ දෑස් නිලංකාර වී යන හෙයින් එය ඉවත් කිරීමට ඇරයුමක් ලෙස නොවේ ද? මෙතෙක් කල් නොදුටු රාධාගේ අඟ පසඟ නිසා දෑස් නිලංකාර වන බවක් ද කවියා එහි දී ගම්‍ය කරයි. රාධාගේ සුන්දරත්වය දැකීමෙන් සිතේ ඇති වූ අසීමිත ආශාව මගින් හැඟීම් උද්දීපනය වී දෑස් නිලංකාර වූ බවක් ද එමගින් ගම්‍ය වේ.

මේ මොහොතේ ඇති වූ රාගය නම් විභාව උද්දීපන වීමට බාහිර පරිසරයත් බලපා ඇති බව පෙනෙයි. රෑ හඳ එළියෙන් මුසපත් වූ රාධා කියන්නේ මිණි කැටවලින් සාදා තිබෙන මණිමේඛලාව ගිලිහී ගිය ද ගැටලුවක් නොවන බව හා ඇය දෑස් වසාගෙන සිටින බව යි. එනම් මිණිමෙවුල ගලවන ලෙසින් ක්‍රිෂ්ණාට ඇරයුමක් කරනු ලබයි. එනම් මෙයින් අදහස් වන්නේ රාධා ක්‍රිෂ්ණා වෙනුවෙන් මෙතෙක් කල් රැක ගත් ඇයගේ පාරිශුද්ධත්වය ඇයගේ වටිනා ම දේ මේ අවස්ථාවේ දී ක්‍රිෂ්ණා වෙනුවෙන් පූජා කිරීමට ඇය සූදානම් බව යි. අලංකාර ලෙස අකුරු අමුණමින් ධම්මික බණ්ඩාර මේ බව අපට පවසයි. රාධාට ක්‍රිෂ්ණා ඉදිරියේ රැක ගැනීමට, ආරක්ෂා කර ගැනීමට දෙයක් නොමැත. ආදරයෙහි ශෘංගාරය කෙතරම් අලංකාර ලෙස ගොනු වී ඇති ද යන්න මෙයින් පෙනෙයි. ශෘංගාරය අසභ්‍ය නැත. එය නව නළු රසයන්ගෙන් තවත් එක් රසයක් පමණි. එහෙත් මෙම රසය ඉදිරිපත් කිරීමේ දී කෙතරම් සංයමයෙන් සදාචාරවත් ලෙස ඉදිරිපත් කළ යුතු ද? යන්න කවියා දැන සිටිය යුතු ය. ආදරයේ රහස්‍යභාවය රහසක් ලෙස ම සඟවාගෙන එලෙස ම ව්‍යංග්‍යාර්ථවත් ලෙස ශෘංගාරය ගැබ් කරමින් කවිය නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කළ හැක්කේ ප්‍රතිභාපූර්ණ වූ කලාකරුවෙකුට පමණි. වචන ඇසීමෙන් සවන් දෙන්නාට එම වචන තුළ අපහසුතාවක් ජනනය නොවීමට කවියා වග බලා ගත යුතු ය. මෙලෙස නිර්මාණාත්මක ව භාෂාව හැසිරවීමට ධම්මික බණ්ඩාර සමත් වී ඇත. ධම්මික බණ්ඩාරගේ මෙම ගීතයෙන් සහෘදයා වන අප ව අපූරු චමත්කාරයෙන් පිරි ලොවකට රැගෙන යාමට ඔහු සමත් වූ අතර එබැවින් එතුමාගේ මෙම ගීතය සාර්ථක නිර්මාණයක් ලෙස අගය කළ හැකි ය.

9 772950 655005

## ආශ්‍රිත මූලාශ්‍රය

මණිමේකලාව. (2019.03.23). යූ ටියුබ් සමාජ මාධ්‍ය. https://youtu.be/pnNwvAua2hU

හිම දිය වී හිමාලයේ. (2018.12.11). යූ ටියුබ් සමාජ මාධ්‍ය. https://youtu.be/14XHXnI5vJU

හිම දිය වී හිමාලයේ. (2020.10.11). යූ ටියුබ් සමාජ මාධ්‍ය. https://youtu.be/jxfVjuTxn3A

හිම දිය වී හිමාලයේ. (2020.05.23). යූ ටියුබ් සමාජ මාධ්‍ය. https://youtu.be/KyDNK41Si9E

හිම දිය වී හිමාලයේ. (2020.01.10). යූ ටියුබ් සමාජ මාධ්‍ය. https://youtu.be/VFoQhmyl0vo

හිම දිය වී හිමාලයේ. (2021.04.09). යූ ටියුබ් සමාජ මාධ්‍ය. https://youtu.be/Y3o8WIJO1Z4

සී.ආර්. වීදාගම
දෙවන වසර
රුහුණ විශ්වවිද්‍යාලය
jeewaweedagama@gmail.com

9 772950 655005